# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2039/27 – 2017 ඔක්තෝබර් මස 04 වැනි බදාදා – 2017.10.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/ 1978 (X)

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

25අ වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින් ලියාපදිංචි අංක පී.වී. 62877 සහ අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සමාගමක් වන හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2016 ජූලි මස 14 වැනි දින අංක 1975/47 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයේ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී ගෞරව උපාධිය යන සටහනට සහ එහි II වන තීරයේ අනුරූපී සටහනටද ඉක්බිතිවම පහත I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, පහත II වන උපලේඛනයේ දැක්වෙන අයිතම පිළිවෙලින් එකතු කිරීමෙන් එම නියමයේ උපලේඛනය සංශෝධනය කරනු ලැබේ.

### I වන උපලේඛනය

***කොන්දේසි***

හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් ජාලකරණ සහ ජංගම පරිගණක තොරතුරු තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධි වැඩසටහන සඳහා ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමේදී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කළ චක්‍රලේඛ අංක 995 ප්‍රකාර, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ කවර හෝ විෂය ධාරාවකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ 3ක් එක්වර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම යන්නට අනුකූල විය යුතුය.


1A – PG3714 – 507 (2017/10)



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

II වන උපලේඛනය

| "I වන තීරය | II වන තීරය |
|---|---|
| *උපාධිය* | *උපාධි සඳහා කෙටි යෙදුම්* |
| ආහාර සුරක්ෂිතාව සහ ශාක හා සත්ත්ව ස්වරථතාව පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමා පඨමාලාව | පී ජී ඩිප් (ආහාර සුරක්ෂිතතාව සහ ශාක හා සත්ත්ව) ස්වස්ථතාව) |
| ජාලකරණ සහ ජංගම පරිගණක තොරතුරු තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධිය | බී අයි ටී ගෞරව (ජලාකරණ සහ ජංගම පරිගණක)" |

හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් සම්බන්ධයෙන් ඉහත සඳහන් පනතේ 25අ වගන්තිය යටතේ සාදන ලද 2017 ජනවාරි මස 20 වන දිනැති සහ අංක 2002/72 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද නියමය යටතේ නීත්‍යානුකූලව කරන ලද කිසිවකට අගති විරහිතව එකී නියමය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2017 ඔක්තෝබර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

10 – 585

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.